# සිංහල

# විෂය මාලාව

# 2007

10 ශ්‍රේණි පළමුවන බස සිංහල විෂය නිර්දේශ අන්තර්ගතයි.

සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

නිපුණතා පාදක ව සකස් කර ඇති මෙම විෂයමාලාව, භාෂා

ශක්‍යතාව සංවර්ධනය මෙන් ම සන්නිවේදන ශක්‍යතාව

සංවර්ධනය ද ප්‍රමුඛ කර ගන්නකි.

පාසලේ දී පමණක් නොව මුළු ජීවිත කාලයේදී ම

ප්‍රායෝගික භාෂා කාර්යයන්හි දී

විපුල ඵල නෙලා ගත හැකි වන පරිදි

නිපුණතා රැසක් ප්‍රගුණ කර ගැනීම අවධාරණය කර ඇත.

# සිංහල

## විෂය නිර්දේශය

(2007 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි.)

## 10 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

1.0 නිපුණතාව

සන්නිවේදනය සාර්ථක කරගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසඥතාව වර්ධනය කර ගනියි.

- නාට්‍ය ගීතයක්

  (කුවේණි, මනමේ, සිංහ බාහු වැනි වැනි නාට්‍යයක ගීයක් සහ නූතන නාට්‍ය ගී සසඳමින් රස විඳීම.)

1.2 විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.

- ශාස්ත්‍රීය සංවාද
- ශාස්ත්‍රීය සාකච්ඡා
- සංවාද, සාකච්ඡා, දේශන අඩංගු ලිපි හෝ නිර්මාණ.

1.3 විද්‍යුත් මාධ්‍ය නොවන දේශන සාකච්ඡා ආදියට සවන්දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.

- දේශන, විවාද, සාකච්ඡා

1.4 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.

- විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන්දීම.

- ප්‍රවෘත්ති ප්‍රකාශ
- සංස්කෘතික ජාතික උත්සව පිළිබඳ වැඩසටහනක්.
- කාලීන වැඩසටහනක පිටපතක්.
- ස්වභාවික විපත් පිළිබඳවැඩසටහනක්.

2.0 නිපුණතාව

අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි.

2.1 කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා නිවැරදි ව කතා කරයි.

- මාතෘකානුකූල කතා
- ක්ෂණික කතා
- චරිතාරෝපිත කතා

2.2 තර්කානුකූල ව හා විචාරශීලී ව කතා කරයි.

- විවාද
- බුද්ධි මණ්ඩල සාකච්ඡා
- වදන් සකසුරුවම් ලෙස යොදා ගනිමින් කෙරෙන විවාද හෝ බුද්ධි මණ්ඩල සාකච්ඡා ඇතුළත් කණ්ඩායම් ක්‍රියාකාරකමක්.

2.3 ආකර්ෂණීය හා නිවැරදි ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි.

- අවුරුදු උත්සවය.
- උදය රුස්වීම - ජාත්‍යන්තර ගුරු දිනය සඳහා.
- ක්‍රීඩා තරගයක්, පාසල් කලා උළෙලක්, විද්‍යා දිනයක්, ශිෂ්‍ය නායක දිනයක් වැනි උත්සවයක් ගැන කෙරෙන සජීව විස්තර කථනයක්.

3.0 නිපුණතාව

ජීවිත අත්දැකීම් ලබා ගැනීම සඳහා කියවීමේ පුරුදු වර්ධනය කර ගනියි.

3.1 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්දව කියවයි.

- නූතන හෝ පුරාතන ගද්‍ය නිර්මාණ

- නවකතා
- ජාතක කතා
- ශාස්ත්‍රීය ලේඛන

3.2 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.

- ශ්‍රැති ගෝචර රටාව අනුව කියවීම.

- පැරණි ගද්‍ය සාහිත්‍ය නිර්මාණයක කොටසක්
- ජාතක පොත, බුත්සරණ, සද්ධර්ම රත්නාවලිය

- තමා අභිමත ශෛලීය අනුව කියවීම.

- නූතන ගද්‍ය, කෙටිකතා, කතන්දර, ශාස්ත්‍රීය ලේඛන

3.3 පොත පත කියවීමෙන් ස්මරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.

- පද්‍ය කිපයක, ගීතයක ගද්‍ය නිර්මාණයක අන්තර්ගත කරුණු සාරාංශ කර ඉදිරිපත් කිරීම.
- පද්‍ය ගීත හා ගද්‍ය කොටස් ආදිය මතකයෙන් ඉදිරිපත් කිරීම.

4.0 නිපුණතාව

අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි..

4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කරයි.

- මාතෘකානුකූල රචනා
- චරිත කතා
- කතු වැකි

4.2 ශිල්ප දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

- පද බෙදීම

- උපසර්ග වෙන්කොට නොලියයි.

උදා :- අතිවිශේෂ උපගුරු
අතිප්‍රබලඋපසභාපති
අනුනායක
අනුකම්ටුව

- ක්‍රියාපදවල ප්‍රත්‍යය එක්ව ද නිපාත පද වෙන්ව ද ලියයි.

උදා :- නිමල් ඔහුට කතා කළේය.
නිමල් කතා කළේ ඔහුට ය.
ඔහු සමඟ මිතුරෙකු ද ආවේය.
විශේෂ උවමනාවකට සඳුනී ආවාය.
සඳුනි ආවේ විශේෂ උවමනාවකට ය.

- පදයක අගට යෙදෙන ප්‍රත්‍යය එක්කොට ලිවිය යුතු ය.

නුවරවල් ග්‍රන්ථයෙන් රත්නපුරයෙහි
මිනිසාට පොත්වලින් ලන්ඩන්හි
නිව්යෝක්වලට

- විශේෂණ වශයෙන් පවතින ඇතැම් පද වෙන් ව ලියයි.

ශ්‍රී ජයවර්ධන පුර
මැද කොළඹ
උතුරු කළුතර
සමරු ඵලකය
ග්‍රාම ලේකම් කාර්යාලය
රතු කමිසය
_____
____
____
___

5.0 නිපුණතාව

හාෂා ක්‍රියාකාරකම් මගින් වාග්මාලාව පෝෂණය කර ගනියි.

5.1 සාම්ප්‍රදායික යෙදුම්, භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.

- ඉඟිවැකි සහ ප්‍රස්තාව පිරුළු
  - ඥාති සම්බන්ධතා ආශ්‍රිත ව බිහිවුණු ප්‍රස්තාව පිරුළු

    කිරි රස දන්නෝ මව් හඳුනන්නෝ
    දරුවන් ඇනූ කැම දිව බොජුන්ලූ
    ඇනෙකුට කිරිදුන්නත් පුතකුට කිරිදීලා පිරිමහන්න බැරිලූ
    එකා යකා වුණා වගේ
    මගුල්දාට මුත්තාත් අමුත්තාලූ
    ආරේ ගුණ නැරේ
    හඩන කොටලූ කිරි එරෙන්නෙ

  - ගෙදර දොර ජීවිතය හා සම්බන්ධ ප්‍රස්තාව පිරුළු

    උපන් ගෙයි ගතිය බලි ඇරියත් නැරේ
    දෙන්න දෙමාල්ලන්ගෙ දබර බත ඉදෙනකල් විතරලූ
    අත් අරෙන දීගෙ හෙවනැල්ලත් ඇදලූ

  - කැම්බීම් හා සම්බන්ධ ප්‍රස්තාව පිරුළු

    අප කන හැටි ලිපා දනී.
    බතේ අරුමෙ දැනෙන්නෙ හාමතේ දී
    හිඟන්නන්ට කොයින් ද උණුබත්
    නමින් කොස් වත්තේ කන්ට පොලොසුත් නැත්තේ
    දෙල් ඇති තැනට මයි කොසුත්
    පිස්සිගෙ පළා මල්ල වගේ

ඉඟි වැකි - උදාහරණ - ලෑල්ලට පාගලා ගියා, අනුනවයෙන් බේරුණා.

- ආතෝපදේශ

    පනින්නට පෙර සිතා බලනු
    කල දුටු කල වල ඉහගන්
    වත්ත බද්දට දී ඇස්ස ට දත නියවන්ට එපා

5.2 විවිධ භාෂා ව්‍යවහාර හඳුනාගනිමින් සන්නිවේදනය පහසු කර ගනියි.

- නුවර කලාවිය ප්‍රදේශය ආශ්‍රිත ජනවහර ඇතුළත් නිර්මාණයක්
  - කමත්බස පිළිබඳ ලියවුණු නිර්මාණයක්
  - පාරිභාෂික පද පිළිබඳ ලියවුණු නිර්මාණයක් (ආර්ථික විද්‍යාව, විද්‍යාව වැනි විෂයයන්ට අදාළව)

6.0 නිපුණතාව

ජීවිත අවශ්‍යතා සාක්ෂාත්කරණය සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

6.1 අදහස් නිරවුල් ව හා භාෂාව නිවැරදි ව භාවිත කරමින් විවිධ ලේඛන සකස්කරයි.

- අත් පත්‍රිකා
  - ආකෘතිය
    - මාතෘකාව, පළකරන්නාගේ නම, දිනය, ලිපිනය.
  - අන්තර්ගතය.

6.2 ආකෘති පත්‍ර පිරවීමේ හා ආකෘති පත්‍ර සකස් කිරීමේ පරිචය ලබයි.

- ආකෘති පත්‍ර සකස් කිරීම.
  - ආකෘති පත්‍රයක ඇතුළත්විය යුතු තොරතුරු සහිත ඡේදයක් / පුවත්පත් දැන්වීමක් අනුසාරයෙන් ආකෘති පත්‍රයක් සැකසීම.
  - ජීව දත්ත අඩංගු ආකෘති පත්‍රයක් සැකසීම.
  - ආකෘති පත්‍ර සකස් කිරීමේ දී අනුගමනය කරන නූතන ක්‍රම ශිල්ප.

6.3 තොරතුරු ප්‍රකාශනය සඳහා, පුවත්පත් වාර්තා සකස් කරයි.

- පුවත්පත් සඳහා වාර්තා ලිවීම.
  - වාර්තා ලිවීමේ දී සැලකිය යුතු කරුණු
    - සත්‍ය බව
    - කෙටි වැකි
    - සාරවත් බව
    - සාරාංශකරණයක් තිබිය යුතු බව.
    - තීරු ක්‍රමය / වාර්තා කථනයෙන් ලවීම.
    - මාතෘකාවේ වැදගත් බව.
    - ආකෘතිය - සිත් ගන්නා මාතෘකාවක් හා වාර්තාකරන්නාගේ නම / නම්

- වාර්තා වර්ග

- රුස්වීම් පිළිබඳ වාර්තා
- සිද්ධි පිළිබඳ වාර්තා
- කල්පිත වාර්තා ( පිටසක්වලින් ජීවීන් පැමිණීම
  අද්භූත අපූර්ව සත්වයෙක් මතුවීම වැනි අවස්ථා. )
- න්‍යාය පත්‍ර

7.0 නිපුණතාව

නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් ලියයි.

7.1 ණ, න, ල, ළ, ශ, ෂ, ස අකුරු සහිත වචන නිවැරදි ව ලියයි.

- ණ, න, ල, ළ භාවිතය හා සම්බන්ධ රීති

- සඤ්ඤක අකුරකට මුලින් යෙදෙන්නේ මූර්ධජ අකුරු ය.
  ඔළිඳ, කොළඹ, ළඟ

- ‍ය වැරදි ලෙස භාවිත කරන අවස්ථා
  $ර `යන්නට පසුව $‍ය` ය නොයෙදෙන බව
  ආචාර්ය, සූර්යයා, කාර්යාලය
  රකාරාංශය හා රේඵය යෙදීම
  ක්‍රමය, ශ්‍රමය, වගබ්

- නිශ්චිත රීතියට අයත් නොවන ණ, න, ල, ළ යෙදෙන වචන

| | | | |
|---|---|---|---|
| කල | - කාලය | කළ | - කළගෙඩිය, කරන ලද |
| කලු | - කාන්තිමත් | කළු | - එම පැහැය |
| ඵල | - ගෙඩිය, විපාක | පළ | - ස්ථානය |
| පැල | - කුඩා නිවහන | පැළ | - පැළෑටි |
| මුලු | - මුල්ලවල් | මුළු | - සියල්ල |
| හල | - ශාලාව | හළ | - හරින ලද |
| දරන | - දරන්නාවූ | දරණ | - දහරය |
| නය | - න්‍යාය | ණය | - ආපසු දෙන්නට ගත් යමක් |

8.0 නිපුණතාව

වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි.

8.1 පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

- ව්‍යවහාරයේ පවතින සන්ධි පිළිබඳ විග්‍රහ කිරීම .

  නිදසුන්

  පහ + හමාර - පහාමාර

  පොත් + අල්මාරිය - පොත්තල්මාරිය

  ඉඳි + ආප්ප - ඉඳියාප්ප

  පොල් + අත්ත - පොල්ලත්ත

  ලෝප ආගම ආදේශ සන්ධි විධි සහිත කොට පද සන්ධි කිරීම

8.2 සම්මත රීතිවලට අනුව වාක්‍ය ලියයි.

- කර්මකාරක වාක්‍ය

  - කර්මකාරක වාක්‍යවල විවිධ ස්වරූප

    විදුහල්පතිතුමා විසින් ශිෂ්‍යයා කැඳවෙයි.

    විදුහල්පතිතුමා විසින් ශිෂ්‍යයා කැඳවනු ලැබේ.

    විදුහල්පතිතුමා විසින් ශිෂ්‍යයා කැඳවනු ලබයි.

    විදුහල්පතිතුමා විසින් අපි කැඳවනු ලැබීමු.

    විදුහල්පතිතුමා විසින් අපි කැඳවන ලද්දෙමු

    ආදී වශයෙනි.

  - පුවත්පත් සිරස්තලවල කර්මකාරක වාක්‍ය රටාව

    ගම්පහදී නවරෝහලක් විවෘත කෙරෙයි.

    ඔරුවල වානේ කම්හල වැසෙයි.

- විවිධ නිපාත පද වාක්‍යවල යෙදීම හා සම්බන්ධ රීති.

  ද, ත්, යි

  හෝ

  හෙවත්, නොහොත්

  සහ, හා, සමඟ, කැටුව ආදී නිපාත පද උක්ත පද සමඟ සම්බන්ධ වීමේ දී උක්තාඛ්‍යාත පද සම්බන්ධය ගැළපීම.

9.0 නිපුණතාව

භාෂා භාවිතය මගින් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය වර්ධනය කරගනියි.

9.1 සංස්කෘතික උරුමයන් හා හර පද්ධතීන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

- සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ව ලියවුණු ලිපියක්.
  - ජේතවනාරාමය
  - සඳකඩ පහණ
  - තෝනිගල සෙල් ලිපිය
  - බිසෝකොටුව, සීගිරිය වැනි උරුමයන් ගැන කියවෙන ලිපියක්.
  - විවිධ සංස්කෘතික උත්සව
  - සිංහරාජ වනය.

9.2 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

- දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ
  ගීතයක් ( නූතන / පැරණි )
  ඓතිහාසික නවකතාවක කොටසක්
  දේශාභිමානී නාට්‍යයක කොටසක්
  රට, දැය, සමය හා භාෂා සාහිත්‍ය උදෙසා මහඟු මෙහෙවරක් කළ පුද්ගල චරිත

9.3 විවිධ ජනකොට්ඨාසවලට අයත් සිරිත් විරිත් හඳුනාගෙන අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

- විවිධ ජනකොට්ඨාසවල සිරිත් විරිත් ඇතුළත් ලිපියක්.
  - වැදි ජනයාගේ සිරිත්
  - අලුත් සහල් මංගල්‍යය
  - පූජනීය හා වෙනත් උත්සව

9.4 ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතු ව කටයුතු කිරීමේ පුරුදු ඇති කර ගනියි.

- ජාතික සමගිය, සහජීවනය පිළිබඳ ලියවුණු නිර්මාණයක්.
  - ක්‍රිකට් ක්‍රීඩකයන් ලෝක සූරයන් වීම පිළිබඳ ලියවුණු ලිපියක්.
  - නිදහස් උත්සවය පිළිබඳ ලියවුණු ලිපියක්
  - ජනයා එකමුතු ව වැඩ කරන අවස්ථාවක්
    (ගොයම් කැපීමක්, ශ්‍රමදානයක්)

10.0 නිපුණතාව

නව සාහිත්‍ය දාර්ශනික විද්‍යාත්මක සහ තාක්ෂණික දැනුමෙන් යුත් නිර්මාණ පරිශීලනයෙන් භාෂා හැකියා වර්ධනය කර ගනියි.

10.1 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල කැපී පෙනෙන භාෂා රටා, සම්ප්‍රදායන් හා සුවිශේෂතා අධ්‍යයනය කරයි.

- නූතන සාහිත්‍ය විචාරය පිළිබඳ ලියවුණු ලිපි
  ( ස්වාධීන හා පරිවර්තන නවකතා/ කෙටිකතා/ ගීත/ නාට්‍ය ආදිය පිළිබඳ ව)

10.2 විද්‍යාත්මක තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත අවබෝධයෙන් කියවා ලබා ගත කරුණු භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

- පරිගණක තාක්ෂණය පිළිබඳ ව නිර්මාණාත්මක ලේඛනයක්.

11.0 නිපුණතාව

රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

11.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රස විඳියි.

- නූතන / පැරණි ගද්‍ය, පද්‍ය, ගීත නිර්මාණ.
  ජාතක කතා, සද්ධර්ම රත්නාවලිය, බුත්සරණ, අමාවතුර, උමංදාව වැනි පොත්වලින් උපුටා ගත් කතා
  පරිවර්තන නවකතාවක කොටසක් හෝ පරිවර්තන කෙටිකතාවක්
  නිසඳැස් පද්‍ය නිර්මාණයක්
  විවිධ වෘත්තීන් හා බැඳුණු ජනකවි

11.2 විවිධ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

- සාහිත්‍ය විචාරයේ මූලික සිද්ධාන්ත ඇතුළත් රසාස්වාදය හා විචාරය පිළිබඳ ව ලියවුණු ලිපියක්
  කල්පනා ලෝකය නිර්මාණ පසුබිම වැනි කෘතියකින් උපුටාගත් කොටසක්.නවකතා, කෙටිකතා, සිනමා නිර්මාණ, ටෙලි නාට්‍ය, වේදිකා නාට්‍ය ආදිය පිළිබඳ විචාරයක්.

12. 0 නිපුණතාව

- අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

12.1පද්‍ය රචනා නිර්මාණය කරයි.
නිදහස් පද්‍ය රචනය.

- ගී පද රචනා කිරීම.

12.2 නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියයි.

- මාතෘකානුකූලව නිර්මාණාත්මක වාක්‍ය රචනා ලිවීම.

12.3 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

- ඓතිහාසික පුවතක් හෝ සමාජමය අත්දැකීමක් පදනම් කරගෙන ප්‍රබන්ධ ලිවීම.
- සිය අත්දැකීම් පදනම් කරගෙන කෙටිකතා ලිවීම.
- පුවත් පත් සඳහා ලිපි ලිවීම.

12.4 කෙටි නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

- සරල තේමාවන් යටතේ නාට්‍ය පිටපත් රචනා කිරීම.